මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.07.31 |

# ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනයන් කාලානුරූපීව ග්‍රහණය කර ගැනීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව 2017 වසරේ ජූනි මස සිට ඉදිකිරීම් අංශය සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයක් ආරම්භ කරන ලදී. මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා සහාය වෙමින් මෙම සමීක්ෂණය වසර හයක් පුරා අඛණ්ඩව සිදු කරන ලදී. දැනට මහ බැංකුව විසින් නිෂ්පාදන සහ සේවා පිළිබඳ අනෙකුත් ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක දෙකක් මාසිකව නිකුත් කරනු ලබයි. එබැවින්, 2023 වසරේ ජූනි මස සිට මහජනතාවගේ දැනගැනීම උදෙසා ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයේ ප්‍රතිඵල ද නිකුත් කිරීමට මහ බැංකුව තීරණය කරන ලදී.

2023 වසරේ ජූනි මාසය සඳහා වන ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයේ ප්‍රතිඵල පිළිබඳ වාර්තාව පහත දැක්වේ. මින් ඉදිරියට සමීක්ෂණ ප්‍රතිඵල මාධ්‍ය නිවේදනයක් හරහා මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ සංඛ්‍යාති අංශය යටතේ ද මාසිකව ප්‍රකාශයට පත් කරනු ඇත.

# ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ජූනි 2023

**සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**

**2023 ජූනි**

**44.4**

**ඉදිකිරීම් ක්‍රියාකාරකම්හි අඛණ්ඩ පසුබෑම පෙන්නුම් කරමින් ඉදිකිරීම් කටයුතු සඳහා වූ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය 2023 ජූනි මාසයේදී 44.4ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.** ඉදිකිරීම් ව්‍යාපෘතිවල හිඟතාවය හේතුවෙන් බොහෝ ඉදිකිරීම් ආයතන අඩු කාර්යසාධනයක් වාර්තා කලද, ඉදිකිරීම් සඳහා භාවිතා කරන අමුද්‍රව්‍යවල මිල ගණන් අඛණ්ඩව පහත වැටීම හේතුවෙන් සුළු පරිමාණ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා යොමුවීමක් පවතින බව සමහර ප්‍රතිචාර දැක්වූවන් ප්‍රකාශ කරන ලදී.

නව ව්‍යාපෘතිවල පවතින හිඟතාවය මගින් ඉදිකිරීම් කර්මාන්තයට ඇති වූ බලපෑම පෙන්නුම් කරමින් නව ඇණවුම් දර්ශකය ජූනි මාසයේ දී ද පහත වැටුණි. සමීක්ෂණය සඳහා ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කල පරිදි විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති කිහිපයක් හැර මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රමාණවත් තරම් නොපවතින අතර එම ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ලබාගැනීම සඳහා ද ඉහළ තරඟකාරීත්වයක් පවතී. කෙසේ වුවද, දැනට අත්හිටුවා ඇති මහා පරිමාණ ව්‍යාපෘති වසර අවසන් භාගය වන විට ක්‍රමයෙන් නැවත ආරම්භ කරනු ඇතැයි ඔවුන් අපේක්ෂා කරනු ලැබේ.


තවද, ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති ක්‍රමයෙන් අවසන් වීමත් සමග ඒවායේ සේවකයන් ඉවත් කිරීම හේතුවෙන් සේවා නියුක්තිය ද ජූනි මාසයේ දී පහත වැටුණි. එසේම, නිමකිරීමට ඉතිරිව ඇති වැඩ ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වීමත් සමගම තොග මිලදී ගැනුම් ද පහත වැටුණි. මේ අතර, ඇණවුම් ප්‍රමාණය අඩු වීම හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ද ජූනි මාසයේ දී අඩු විය.

| විචලයය | මැයි | ජූනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **සමස්ත ක්‍රියාකාරකම්** | **47.1** | **44.4** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| නව ඇණවුම් | 42.9 | 38.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 22.9 | 30.6 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 45.7 | 41.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 44.3 | 47.2 | + | අඩු වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික වාතාවරණය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම, ආනයන සීමා ලිහිල් කිරීම සහ අත්හිටුවා ඇති ව්‍යාපෘති නැවත ආරම්භ කරනු ඇතැයි බලාපොරොත්තු වීම හේතුවෙන් ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා යහපත් මට්ටමක පැවතුණි. කෙසේ වුවද, වෙළඳපොළ ණය පොලී අනුපාතික පහත වැටීම මන්දගාමීව සිදුවීම පෞද්ගලික අංශයේ ඉදිකිරීම් ව්‍යාපෘති පමාවීමට හේතු වන බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී.

ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය[1]

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගය පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

## විචලයයන්ගේ අර්ථ නිරූපණයන්

සමස්ත ක්‍රියාකාරකම් : ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල සමස්ත පරිමාව. මෙය ජාත්‍යන්තර ක්‍රමවේදය අනුගමනය කරමින් "ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය" ලෙස හදුන්වන මුලික දර්ශකය වන අතර එය කර්මාන්ත අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය හා සැසඳිය හැකි වේ..

සේවා නියුක්තිය: සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන.

මිලදී ගැනීම් ප්‍රමාණය: නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන ගබඩා කර තැබීම.

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය: සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය.

අනෙකුත් විචලයයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.

## සමීක්ෂණ ප්‍රතිචාර

මාසික ප්‍රතිචාර **35**ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ශව අදාල මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

[1]ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කර ඇත්තේ ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදකයා ලෙස හඳුනාගෙන ඇති ලොව පුරා ආර්ථිකයන් 40කට අධික සංඛ්‍යාවක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදනය කරනු ලබන එස්**&**පී ග්ලෝබල් (S&P Global) අනුගමනය කරනු ලබන ක්‍රමවේදය භාවිතයෙනි.

**පෙර මාසවල ඉදිකිරීම් කටයුතු සඳහා වන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**

| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | - | 55.8 | 47.7 | 41.5 | 66.7 | 54.1 | 36.5 |
| පෙබරවාරි | - | 52.2 | 63.6 | 40.0 | 68.4 | 47.2 | 37.8 |
| මාර්තු | - | 44.0 | 50.0 | 14.0 | 72.9 | 30.3 | 45.8 |
| අප්‍රේල් | - | 45.7 | 26.9 | 10.0 | 31.7 | 7.5 | 26.4 |
| මැයි | - | 52.1 | 50.0 | 66.7 | 29.7 | 3.8 | 47.1 |
| ජූනි | 60.0 | 56.3 | 52.0 | 71.4 | 52.7 | 6.9 | 44.4 |
| ජූලි | 63.5 | 50.0 | 63.8 | 75.7 | 51.4 | 22.2 | - |
| අගෝස්තු | 60.0 | 50.0 | 53.2 | 73.2 | 32.9 | 32.9 | - |
| සැප්තැම්බර් | 50.0 | 50.0 | 43.1 | 72.1 | 51.4 | 44.6 | - |
| ඔක්තෝබර් | 53.8 | 45.8 | 56.7 | 35.7 | 71.6 | 32.9 | - |
| නොවැම්බර් | 59.3 | 40.0 | 53.6 | 39.1 | 63.2 | 30.3 | - |
| දෙසැම්බර් | 50.0 | 35.7 | 40.4 | 70.3 | 61.4 | 32.9 | - |